05/09/2010 - ඉරිදා ලංකාදීප

**අලුත් ආකල්ප අනුව නව මගකට යොමු විය යුතු දේශීය කෘෂිකර්මය -මිලින්ද මොරගොඩ**

කෘෂිකර්මය සම්බන්ධයෙන් වර්තමානයේ දී අලුත් උනන්දුවක් ඇත. සුළු වශයෙන් හෝ ස්වකීය ගෙවත්තේ වගා කිරීමට මහජනතාව කැමැත්තක් දක්වයි. ආණ්ඩුව වී ගොවීන්ට සහනාධාර වශයෙන් පොහොර සපයයි. මේ අතර තිස් වසරකට පසු උතුර නැගෙනහිර ප්‍රදේශවල අලුත් කෘෂිබිම් අස්වද්දා තිබේ. මේ නිසා නිෂ්පාදනය වැඩි වන ලකුණු පෙනෙන්ට තිබේ. ඒ සමගම ගොවීන්ට ස්වකීය නිෂ්පාදන නියම මිලකට අලෙවි කර ගැනීම සම්බන්ධයෙන් ගැටලු මතුවෙන්නට පටන්ගෙන ඇති බව අනාවරණය වෙයි. මෙවර වී අස්වනු අපේක්ෂිත මිලට විකුණා ගත නොහැකිවීම නිසා සිය විරෝධය පළ කර තිබෙන්නේ අස්වනු ගිනි තැබීමෙන්ය.

වී ගොවිතැන ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හා ජනජීවිතය සමග සම්බන්ධය. සිරිත් විරිත් හා චාරිත්‍රානුකූල වතාවත් වී ගොවිතැන වටා පවතී. වී ගොවිතැන හා සංස්කෘතිය අතර පවතින බැඳීම නිතිපතා ශක්තිමත් වන්නකි. මෙවැනි පසුබිමක් සහිත රටක ගොවියා වී අස්වැන්න ගිනි තබන්නේ බරපතල තත්ත්වයක් සනිටුහන් කරමින් බව අවබෝධ කර ගත යුතුය.

වී ගොවිතැන කෘෂිකර්මයේ එක් වැදගත් කොටසකි. අතීත රජ දවස සහලින් රට සංවර්ධනය කර ජන ජීවිතය සමෘද්ධිමත් කරන්නට හැකි වූයේ රජවරු ගොවිතැන සිය දර්ශනයේ වැදගත් කොටසක් සේ සැලකූ හෙයිනි. ධාතුසේන රජතුමා කලාවැව සිය ධනය සේ සඳහන් කිරීමෙන් හා පරාක්‍රමබාහු රජතුමා එක දිය බිඳක් හෝ නිසි ප්‍රයෝජනයට නොගෙන මුහුදට නොයවන්නේ යැයි ප්‍රකාශ කිරීමෙන් ද එය සනාථ වෙයි. වැවයි දාගැබයි හා ගමයි පන්සලයි යන සංකේත ව්‍යවහාරයට පැමිණියේ ද මෙම උරුමය අනුවය. අතීතයේ ද කෘෂිකර්මය පමණක් පැවතුනේ නැත. වී ගොවිතැන දියුණු කර කෘෂිකර්මය හා සමාන්තරව වෙළඳාම ද දියුණු කර තිබේ. අනුරාධපුරය, ත්‍රිකුණාමලය වැනි නගර දෙස් විදෙස් ප්‍රකට වෙළඳ නගර ලෙස පැවතිණි. කුරුඳු, ගම්මිරිස් ඇතුලු සුළු අපනයන භෝග, මුතු මැණික් හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය හුවමාරු වී ඇත්තේ මෙම වෙළඳ නගර වලදීය. වෙළඳාමට ඉඩදී එයින් උපයන බදු ආදායම යළි ආයෝජනය කර ඇත්තේ වැව් අමුණු සකස් කර ගොවිතැනට අවශ්‍ය යටිතල පහසුකම් නංවන්නටය. වෙළඳ පසුබිමට ඉඩ තිබීමෙන් ලාංකිකයන් කෘෂිකර්මය නගා සිටුවන්නට අවස්ථාව ඇති සමාජයක කොටස්කරුවන් වී සිටියහ.

එය අර්බුදයකට ලක්වූයේ යටත් විජිත ආක්‍රමණය සමගය. සාම්ප්‍රදායික ගොවිතැන විනාශ කර වැව් අමුණු බිඳ දැමීමෙන් ලංකාවේ සංස්කෘතිය හා අනන්‍යතාව වෙනස් කළ බටහිර ජාතීන් එවකට පැවති කෘෂිකර්මය තමන්ට අවශ්‍ය කෘෂිකාර්මික නිපැයුම් බිහිකිරීම දක්වා ක්‍රමයෙන් පරිවර්තනයකට ලක් කළහ. මෙයින් බිහි වූයේ අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගත් නිෂ්පාදනය. වී වගාව වෙනුවට කෝපි, තේ හා රබර් වගාව ඇති කළ බටහිර ප්‍රජාව වී ගොවිතැන අධෛර්යවත් කළහ.

පසු කාලයක ඇමරිකාව විසින් සහන වැඩපිලිවෙලක් බව දක්වමින් ඇමරිකානු ගොවීන් ගේ තිරිඟු නිපැයුමේ අතිරික්තය පී. එල් හාරසිය අසූව ගිවිසුම අනුව දියුණු වෙමින් පැවති ලංකාව වැනි රටවලට අඩු පොලී ක්‍රමයකට දුන්නේය. මෙය බත වෙනුවට පාන් හා පිටි හුරු සමාජයක් බිහි කරන්නට හේතු විය. ආධාර වශයෙන් ලැබුණ මේ තිරිඟු වෙනුවෙන් ආපසු මුදල් ගෙවිය යුත්තේ පොලී රහිතව අවුරුදු විස්සකට හෝ තිහකට පමණ පසු කාලයකදී බව ගිවිසුමේ සඳහන් විය. ගිවිසුම අනුව ලැබුණ තිරිඟු මහජනතාවට අලෙවි කර එයින් ලැබෙන ආදායම සංවර්ධන වැඩට යොමු කර පසු කාලයකදී ණය ආපසු ගෙවන්නට අවස්ථාව තිබිණ. මෙවැනි පහසුකමක් ලැබුණ තායිලන්තය රෙදිපිළි නිෂ්පාදනයට එම ආදායම හරවා ගත්හ. ශ්‍රී ලංකාව කළේ තිරිඟු ඇඹරීමට අවශ්‍ය කම්හලක් මිලයට ගැනීමයි. අද සිදුව ඇත්තේ ඇමරිකානු තිරිඟු ගොවීන්ගේ නිෂ්පාදන වලට ලංකාව ඇතුලු දුප්පත් රටවල වෙළඳ පොළක් නිර්මාණය වීම පමණකි. දර්ශනයක් ඇතිව ක්‍රියා කළා නම් ඇමරිකානු ආධාර මත දිගටම

යැපෙන වැඩ පිළිවෙලක් නොව නිදහස ලබා ගැනීම සමග ස්වාධීන කෘෂිකර්ම පිළිවෙතක් අරඹන්නට හැකියාව තිබිණ. යටත් විජිතයක් වන්නට කලින් පැවති පෙරදිග ධාන්‍යාගාරයේ අභිමානය කරා යන්නට එයින් ඉඩ පහසුව ගන්නට තිබිණි. නමුත් නිසි දැක්මක් ඇති වැඩ පිළිවෙලක් දියත් නොවීම නිසා ඒ අවකාශය අහිමි කර ගත්තේය.

අතීතයේ මෙරටට ආවේනික වී වර්ග සිය ගණනක් තිබිණි. ඒවා කෘමි හා වෙනත් රෝග වලට ඔරොත්තු දෙන කාබනික පොහොරින් යැපෙන හොඳ අස්වැන්න ගෙන දෙන විශේෂයන්ය. මේ වී වර්ග වෙනුවට ආදේශක පැමිණ කෘෂි හා කෘමි නාශක සමග රසායනික පොහොර අසීමිතව යෙදිය යුතු වැඩි අස්වැන්නක් ඇති වී වගා ප්‍රචලිත කරනු ලැබීය. හේන් වගාව ආර්ථික අතින් අවාසි බව තේරුම් ගැනීම නිසා ගොවීහු එයින් ඈත් විය. දැන් ජගත් ප්‍රජාව ආපසු හැරෙමින් තිබේ. ලෝක ප්‍රජාවගෙන් රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර යෙදූ ආහාර වලට වැඩි ඉල්ලුමක් ඇත. කෘෂි නිපැයුම් වශයෙන් මෙරටින් යැවෙන තේ සමග සසඳන විට වැඩි මිලක් ලැබෙන්නේ කාබනික තේ වලටය. ආහාර හා පළතුරු සම්බන්ධයෙන් ද තත්ත්වය එසේය. ඇතැම් ව්‍යාපාරික සමාගම් නූතන නීති අනුව මෙරට අනන්‍ය ආහාර හා ඖෂධ වලට වානිජ අයිතිය පවා ලබා ගන්නා විට ශ්‍රී ලංකාව සිටින්නේ මේ ගැන සැලසුම් කරන්නට පවා පමා වූ අවස්ථා ඇතිවය.

ආසියාවේ රටවල් තම ආහාර හා වගා ක්‍රම සම්බන්ධයෙන් දක්වන ආකල්ප මෙරට පර්යේෂකයන්ගේ අවධානයට ලක්විය යුතුය. ජපානය, චීනය, තායිලන්තය කොරියාව හා ඉන්දුනීසියාව වැනි වී වගාව බහුලව කරන හැම රටක්ම අඩු මිලට සහල් නිපදවා වැඩි මිලකට අලෙවි කිරීමේ අභියෝගයට සාර්ථකව මුහුණ දෙන්නට සමත්ව සිටී. එහිදී ඔවුන් අනුගමනය කළේ වැඩි අස්වනු ගෙන දෙන තාක්ෂණික වගා ක්‍රමයි. මේ හැම රටක්ම ඔවුන්ගේ හැකියාව අනුව විද්‍යාත්මක ක්‍රම හා තාක්ෂණය උපයෝගී කරගෙන වැඩි අස්වනු හා අඩු වියදම් මගින් සහල් කිලෝවක් නිපදවන්නට යන වියදම අඩු කරගෙන තිබේ. තොරතුරු තාක්ෂණය දියුණු වී ඇති අවස්ථාවක එහි ඇති දැනුම ගොවීන්ට ලබා දී ජාන තාක්ෂණය ඇතුලු ලෝකයේ වැඩි දියුණු පර්යේෂණවල ප්‍රතිපල අප රටට ලබා ගත හැකිය. එයින් කෘෂිකර්මයේ විප්ලවයක් කළ හැකිය. එසේනමුත් ජපානය තම පාරම්පරික ආහාරය වශයෙන් වැඩි මිළක් ගෙවමින් සෝබා වගාව කරගෙන යන්නා සේ ශ්‍රී ලංකාව ද වී ගොවිතැනෙහි නිරත ජනතාව ආරක්ෂා කරයි. ලෝක වෙළඳ පොළෙන් මිළදී ගෙන මෙරට වැසියන්ට අඩු මිළට සහල් සපයන්නට ආණ්ඩුවට හැකිය. අද අභියෝගය වී ඇත්තේ ගොවීන් ආරක්ෂා කර ගනිමින් පාරිභෝගිකයන්ට ද අඩු මිළට ආහාර සැපයීම අරමුණ කර ගත් ගොවිතැන පවත්වාගෙන යන්නේ කෙසේ ද යන්නය.

කෘෂිකාර්මික යුගයෙන් කාර්මීකරණය වීමේ දී අවධානය එකිනෙකට වෙනස් වූ අතර කාර්මීකරණයෙන් පසුව උදා වූයේ තොරතුරු තාක්ෂණ යුගයයි. වර්තමාන ජගත් ප්‍රජාව තොරතුරු තාක්ෂණයේ භාවිතාවෙන් විශාල අවස්ථාවන් සපුරාගනිති. වෙළඳපොළ හැසිරීම ඉල්ලුම හා සැපයුම් සම්බන්ධ තොරතුරු ඉක්මනින් හුවමාරුවීම හෙයින් තොරතුරු තාක්ෂණය සමග සම්බන්ධ නිෂ්පාදකයන් හා සැපයුම්කරුවන් විශාල දියුණුවක් පෙන්වයි. මේ අතර දැන් ඇති වෙමින් පවතින ප්‍රවණතාවය නම් කෘෂිකර්මය හා තොරතුරු තාක්ෂණය එකට බැඳුන යුගයක් බිහිවෙන ලකුණු දැකගත හැකිවීමයි. එපමණක් නොවේ මෙම තොරතුරු හුවමාරුව සමග දැනුමින් පිරි සමාජය වස විස නැති කාබනික පොහොර යෙදූ ස්වභාවික ආහාර හා පරිසර හිතකාමී නිෂ්පාදන වලට ලැදියාවක් දක්වන බව පෙනෙන්නට තිබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය ද මෙතෙක් පැවති සම්ප්‍රදායික මාවතෙන් ඉවත්කර නව සැලසුම් හා ආකල්ප අනුව ලාභදායී හා පරිසර හිතකාමී අන්දමට හසුරවන්නට අපට හැකිවිය යුතුය.

වර්තමානයේ මෙරට කෘෂි ඉඩම් වලින් බොහෝමයක වගා කටයුතු නොකරයි. වී වගා නොකරන අවස්ථාවක වෙනත් බව භෝග වගා කරන්නට පෙළඹවිය යුතුය. ඉඩම් අයිතිය ඇත්තේ ආණ්ඩුවටය. රජය සතු ඉඩම් විශාල ප්‍රමාණයක් වගා නොකර පවතින බව පෙනේ. විවිධාංගීකරණයට යටත් කර ගොවීන්ගේ හා රජයේ ඉඩම් කෘෂිකාර්මික කටයුතු වලට

යෙදවිය හැකිය. සත්ව පාලනය, මිරිදිය හා කරදිය ධීවර කර්මාන්තය, මල් හා පලතුරු නිෂ්පාදනය වැනි විවිධ අංශ වල ඇති අවස්ථා අපමණය. අලුත් බෝග වගාවන් ගැන සැලකිලිමත් විය හැකිය. ඇතැම් කෘෂි ව්‍යාපාර සුළු පරිමාණයෙන් පවත්වාගෙන යාම ලාභ දායක නැත. ගොවීන් සමූහ වශයෙන් සමාගම් සමග සම්බන්ධ කර ව්‍යාපාරික මට්ටමින් අලුත් වගාවන්ට පෙළඹවීමෙන් සාර්ථක ප්‍රතිපල ලඟාකරගත හැකිවේ. යුරෝපයට කෙසෙල් සපයන්නේ අප්‍රිකානු රටවල්ය. කාම්බෝජය මැද පෙරදිගට ආහාර හා පලතුරු සපයන දීර්ඝ කාලීන ගිවිසුම් අත්සන් කර තිබේ. ශ්‍රී ලංකාවට ද කෙසෙල් වගාකර අපනයනය කළ හැකිය. මේ සඳහා අවශ්‍ය වන්නේ නිසි තොරතුරු ඉදිරිපත්කර මග පෙන්වීම පමණකි. මේවා වෙනුවෙන් මෙරට හා විදේශයන්හි ඇති ඉල්ලුම ගැන ගොවීන් දැනුම්වත් කරන්නට තාක්ෂණය භාවිතා කළ හැකිය. ලීනට මෙරට ගොවීන් ගේ නිෂ්පාදන වලින් හරි අඩක් පමණ නිෂ්පාදනයේ සිට පාරිභෝගිකයා අතට පත්වන විට විනාශවී ඉවත දමයි. මේ මිළ ගෙවන්නේ ද පාරිභෝගිකයාය. පළතුරු හෝ වෙනත් ආහාර ද්‍රව්‍යයක් ප්‍රවාහනයේ දී හෝ ගබඩා කිරීමේදී සිදුවන හානි වලකා ගත හැකි නම් එය කෙලින්ම පාරිභෝජනය වන විට පාරිභෝගිකයාට ගෙවන්නට සිදුවන මිළ අඩුය. නිෂ්පාදකයාගෙන් මිළදී ගන්නා දේ අතර මගදී විනාශ වන විට එහි පාඩුව වෙළෙන්දා දරන්නේ නැත.

දැන් රටවල් අතර ඉදිරි අස්වනු ගිවිසුමක් අත්සන් කරන තරමට කෘෂිකර්මය දියුණු වී තිබේ. මේ ගිවිසුම් අනුව කාර්මීකරණයෙන් පොහොසත් රටවල් තමන්ට අවශ්‍ය කෘෂි නිෂ්පාදන ඉදිරි අවුරුදු කිහිපය තුළ ස්ථිර මිළකට මිළදී ගන්නට සූදානම්ය. මෙරට බැංකු සමග සම්බන්ධ වී ඉදිරි අස්වනු මිළදී ගන්නා ක්‍රමවේදයක් ඇති කර ඇත. එය තවත් ව්‍යාප්ත කළහොත් ගොවීන්ට වගා කරන භෝග අලෙවියට ප්‍රශ්න ඇති වන්නේ නැත. මේ සඳහා ගොවීන් සංවිධාන ගත කිරීම අවශ්‍යය. එක් පුද්ගලයෙකුනොව සමුපකාර හෝ සමාගම් අනුව සාමූහිකව වගා කර සාමූහිකව නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කරන ක්‍රමයක් ඇති කළ යුතුය. නවසීලන්තයේ කිරි නිෂ්පාදකයේ වැඩිම ප්‍රතිශතය ඇත්තේ එරට ගොවීන්ගේ සමුපකාර ව්‍යාපාරයටය. ලංකාවේ සාර්ථකව සමුපකාර ව්‍යාපාරය ක්‍රියාත්මක විය. දේශපාලනය විසින් එය අඩපණ කර තිබේ. ගොවීන්ට ස්වකීය ශක්තිය අනුව ස්වාධීනව එය යළි ආරම්භ කර සංවිධාන ගත වුවහොත් ස්වකීය නිපැයුම් අලෙවියේ දී එයින් වැඩි ප්‍රයෝජන අත්පත් කර ගැනීමට හැකිවේ.

ඉතිහාසයට අනුව පිටරටින් වෙළඳුන් මෙරටට ආවේ හොඳම කුළුබඩු මිලදී ගැනීමටය. ලෝකයේ ඉස්තරම් කුරුඳු මෙරටින් නැව් ගත කෙරිණි. පෘතුගීසීන් කුරුඳු පැලයක් කැපීම මරණ දණ්ඩනය පමුණු වන්නට තරම් වැරැද්දක් බව තීන්දු කළේ එහි වටිනාකම එදා දැනසිටි නිසාය. මෙරට ගම්මිරිස් වගාව බෙහෙවින් තිබිණි. නමුත් ඕලන්දයෙන් මිරිස් හා දෙල් ඇතුලු ආහාර කුළුබඩු එන විට ගම්මිරිස් නැති වන්නටත් කොස් වවන්නට විශේෂ දිරිමත් වැඩ සටහන් සකස් කරන්නටත් රටට සිදුවිය. කෝපි. තේ හා රබර් වගා කරමින් කොටු වී ඇති සම්ප්‍රදායික රාමුවෙන් එපිටට යන්නට ක්‍රියාකාරී යාන්ත්‍රණයක් වහා සකස් කළ යුතුය. යුද්ධයෙන් පසු නිදහස්කරගත් විශාල ඉඩම් ප්‍රමාණයක් වගා කරන්නට ගොවීහු සූදානම්ය. මේ ගොවීන්ට සහනාධාර සැපයීම හා නිපදවන වී හෝ වෙනත් බව භෝග මිළදී ගන්නට ආණ්ඩුව මැදිහත්වීම සම්පූර්ණයෙන්ම කළ හැකි දෙයක් නොවේ. වෙළඳපොළ රටාව අනුව ගොවීන්ට නිදහසේ සිය නිෂ්පාදන විකුණන්නට හැකි පරිසරය සකස් නොකර ඔවුන් ආණ්ඩුවේ යැපෙන්නන් කිරීම සමාජයට බරකි. රජයට මේ ප්‍රශ්න විසඳන්නට නොහැකිය. ආණ්ඩුවේ මුදල් ගෙවමින් නිලධාරීන් ලවා ගොවීන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම නිසා අවසාන වන්දිය ගෙවන්නේ මහජනතාවයි. රජයට එය කළ නොහැකිය. ප්‍රතිපත්ති සම්පාදනය කර කෘෂිකර්මයට අවශ්‍ය ඉඩම්, ජලය හා තාක්ෂණය සපයා අලෙවියට අවශ්‍ය ගබඩා හා ශීතාගාර පහසුකම් සපයන්නට රජයට මැදිහත් විය හැකිය.

බොහෝ ආසියානු රටවල් සම්ප්‍රදායෙන් මිදී ඇත. විවිධාංගීකරණයට ලක්ව ඇති අතර වෙළඳපොළට අවශ්‍ය දේ නිපදවන්නට ගොවීන් පොළඹවා තිබේ. මේ රටවල අත්දැකීම් අප පාඩමක් කර ගත යුතුය. කෘෂිකර්මයට ලැදි පවුල් වල සාමාජිකයන් වේගයෙන්

කෘෂිකර්මයෙන් ඉවත් වන්නේ එහි ඇති ලාභදායී බව අඩු වීම හා සමාජ පිළිගැනීම අඩු හෙයින් බව අමතක නොකළ යුතුය. වර්තමානයේ ආසියානු රටවල කෘෂිකර්මයට ඇතුලුවන තරුණන් විශ්ව විද්‍යාල අධ්‍යාපනය සහිත පිරිසකි. ඔවුහු මහා පරිමානයෙන් වගා කර වෙළඳපොළ ජයගෙන තිබේ. ශ්‍රී ලංකාවේ ද සුළු වශයෙන් එය සිදුවෙමින් පවතින අතර එවැනි ධෛර්යවන්ත තරුණ තරුණියන් දිරිමත් කිරීම සමාජයේ වගකීමකි. ඒ අතරම සත්ව පාලනය, ධීවර කර්මාන්තය වැනි අංශ දෙස ද අවධානය යොමු කළ යුතුය. දිවයින වටා පිහිටි මුහුද හා රට අභ්‍යන්තරයේ ඇති වැව් අමුණු සලකන විට ධීවර කර්මාන්තයේ ඇති අවස්ථා අපමණය. මෙරට මුහුදු සීමාවේ මසුන් වෙනත් රටවලින් අල්ලා ගන්නා අතර අප රටට අවශ්‍ය මසුන් හා ටින්කළ මත්ස්‍ය නිෂ්පාදන පිටරටින් ආනයනය කරයි.

මෙරට සංස්කෘතිය හා ආගම විසින් ප්‍රශ්න කරන නමුත් සත්ව පාලනය සම්බන්ධයෙන් ඇති අවස්ථා ගැන අවධානය යොමු කිරීම වටී. මෙරටට අවුරුද්දක් පාසා ආනයනය කරන මාංශ ආහාර ප්‍රමාණය විශාලය. විශාල බෞද්ධ රටක් වන නමුත් තායිලන්තය කුකුලු මස් නිෂ්පාදකයන් අතර ප්‍රධාන තැනක සිටී. හලාල් ක්‍රමයට මාංශ නිෂ්පාදන පිළියෙල කිරීම ගැන ලෝකයේ විශාලම පිළිගැනීම ඇත්තේ ද තායිලන්තයටය.

ගොවිතැන හා කෘෂිකර්මය විවිධ අත්හදා බැලීම් අනුව ලාභදායී අන්දමට පවත්වාගෙන යා හැකි ව්‍යවසායයක් බවට පත් කර ගැනීම අසීරු නැත. අවශ්‍ය වන්නේ නිසි පිළිගැනීම යටිතල පහසුකම් හා වෙළඳ පොළ වැනි මූලික රාමුව සකස් කිරීම පමණකි. කෘෂිකර්මයට ප්‍රවේශ වන අලුත් කණ්ඩායම් දිරිගන්වා ඔවුන්ට එහි ඇති අවදානමක් නැති බව පෙන්වන්නට පමණක් රජය මැදිහත්වීම වඩාත් සුදුසුය.